# මුදල් කොමිෂන් සභාව

**(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 'ඡ' ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලදී)**

# நிதி ஆணைக்குழு

**(அரசியலமைப்பின் 154'எஆம் உறுப்புரையின் கீழ் தாபிக்கப்பட்டது)**

# Finance Commission

**(Established under Article 154 R of the Constitution)**

## වසර 2014 සඳහා වූ මුදල් කොමිෂන් සභාවේ

## වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්

## 2014 ஆம் ஆண்டுக்கானவருடாந்த செயலாற்றுகை அறிக்கையும வருடாந்தகணக்கீடும்

## Annual Performance Report and the Statement of Accounts of the Finance Commission for 2014

# වසර 2014 සඳහා වූ මුදල් කොමිෂන් සභාවේ

# වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්

පටුන


**1. හැඳින්වීම** ........ 4

1.1 මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කිරීම ........ 4

1.2 මුදල් කොමිෂන් සභාවේ බලතල ........ 4

1.3 මුදල් කොමිෂන් සභාවේ මූලික කාර්යයන් ........ 5

**2. මුදල් කොමිෂන් සභාවේ උපාය මාර්ගික යොමුවීම** ........ 5

2.1 දැක්ම ........ 5

2.2 මෙහෙවර ........ 5

2.3 ප්‍රමුඛ පරාසයන් ........ 5

**3. ආයතනික ව්‍යුහය සහ කාර්ය මණ්ඩල තොරතුරු** ........ 6

3.1 මුදල් කොමිෂන් සභාවේ ව්‍යුහය ........ 6

3.2 මුදල් කොමිෂන් සභා ලේකම් කාර්යාලය ........ 6

3.3 2014.12.31 දිනට කාර්ය මණ්ඩලය ........ 7

3.4 කාර්ය මණ්ඩල සටහන ........ 9

**4. මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධනය 2014 -** ........ 10

4.1 ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය ........ 10

4.2 ප්‍රතිඵල පාදක සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අංශය ........ 12

4.3 අයවැය හා පුරෝකථන අංශය ........ 12

4.4 අධීක්ෂණ හා ඇගයීම් අංශය ........ 13

4.5 පරිපාලන අංශය ........ 13

4.6 මූල්‍ය අංශය ........ 16

**5. පොදු පරිපාලනය** ........ 17

5.1 2014 වර්ෂයේ කාර්ය මණ්ඩලය ........ 17

5.2 මුදල් කොමිෂන් සභාවෙන් මාරු කරන ලද නිලධාරීන් - 2014 ........ 18

5.3 මුදල් කොමිෂන් සභාවට කරන ලද නව පත්වීම් - 2014 ........ 18

**6. මධ්‍ය කාලීනව කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා යෝජිත උපායමාර්ග** ........ 19

**7. විගණන වාර්තාව** ........ 20

**2014 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්**

## 1. හැඳින්වීම

### 1.1 මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කිරීම

1987 වර්ෂයේ දී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් පළාත් සභා සහ මුදල් කොමිෂන් සභාව පිහිටුවීමට අවශ්‍ය විධිවිධාන සලස්වන ලදී. පළාත් සභාව විසින් පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමට අදාලව පළාත්වලට සම්පත් බෙදා හැරීම හා පළාත් සැලසුම්කරණ ක්‍රියාවලිය පහසුකරලීම පිණිස මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.

13 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් මුදල් කොමිෂන් සභාවට පැවරෙන මූලික වගකීම් පැහැදිලිව දක්වා ඇත. ඒවා අතර, පළාත්වලට අරමුදල් බෙදා වෙන් කිරීමට අදාල මූලධර්මයන් පිළිබඳව රජයට නිර්දේශ සැපයීම හා රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති වන අයුරින් පළාත් නවය අතර සම්පත් බෙදා වෙන් කිරීම ප්‍රධාන වේ.

### 1.2 මුදල් කොමිෂන් සභාවේ බලතල

මුදල් කොමිෂන් සභාවේ බලතල පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (3) (4) හා (5) යන වගන්තිවල පහත දැක්වෙන පරිදි පැහැදිලිව සඳහන් කර ඇත.

(i) පළාත් අවශ්‍යතා සපුරා ගැනීමේ අරමුණ ඉටු කරලීමෙහිලා ප්‍රමාණවත් වන පරිදි, මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය හා උපදෙස් මත පදනම්ව රජය විසින් වාර්ෂික අයවැයෙන් පළාත් සඳහා අරමුදල් සැපයිය යුතු වේ.

(ii) පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතු වේ.

- (අ) රජය මගින් වාර්ෂිකව පළාත් වෙත සපයනු ලබන අරමුදල් හා ඒවා පළාත් අතර බෙදා වෙන් කිරීමට අදාල වූ ප්‍රතිපත්ති.
- (ආ) පළාත් මූල්‍යකරණය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා විසින් මුදල් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන වෙනත් ඕනෑම කරුණක්.
- (ඇ) රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සහතික කරලීමේ අරමුණ ඇතිව මුදල් කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතු වේ. එහිදී එක් එක් පළාතට අයත් ජනගහනය, එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම, සමාජ-ආර්ථික විෂමතාවයන් වඩ වඩාත් අවම කරලීමේ අවශ්‍යතාවය සහ එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම සම්බන්ධයෙන් පවත්නා වෙනස වඩාත් අවම කරලීමේ අවශ්‍යතාවය යන කරුණු සැලකිල්ලට ගත යුතුවේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (7) වගන්තියෙන් දැක්වෙන පරිදි මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන සෑම නිර්දේශයක්ම අතිගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුව හමුවේ තැබිය යුතු අතර, ඒ පිළිබඳව ගනු ලබන ක්‍රියාමාර්ග ද පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු වේ.

### 1.3 මුදල් කොමිෂන් සභාවේ මූලික කාර්යයන්

(අ) පළාත් අවශ්‍යතාවයන් තක්සේරු කිරීම.

(ආ) වාර්ෂිකව ලබා දෙන අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීම.

(ඇ) එක් එක් පළාත සඳහා වෙන් කරන ලද සමස්ත අරමුදල් ප්‍රමාණය පුනරාවර්තන හා මූලධන වියදම් අවශ්‍යතා සඳහා වෙන් කර දීම.

(ඉ) ප්‍රාග්ධන අරමුදල් "පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන" සහ "උපමාන පාදක ප්‍රදාන" අතර බෙදා වෙන් කිරීම.

(ඊ) හඳුනාගත් සංවර්ධන අංශ/ආයතන අතර පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන බෙදා හැරීම.

(උ) පළාත් අරමුදල් මැනවින් උපයෝජනය කිරීම මගින් තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කර ගැනීමට හැකිවන පරිදි මූලධර්ම හා මාර්ගෝපදේශ සැකසීම.

## 2. මුදල් කොමිෂන් සභාවේ උපාය මාර්ගික යොමුවීම

### 2.1 දැක්ම

සියලුම පළාත්වල තුලිත හා සාධාරණ සමාජ-ආර්ථික සංවර්ධනයක්.

### 2.2 මෙහෙවර

පළාත් විෂයයෙහි තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කරගැනීමේ අරමුණින් ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සැකසීම, සැලසුම්කරණය හා ඊට අවශ්‍ය සහයෝගීතාවය සැපයීම, සම්පත් බෙදා වෙන් කිරීම, සංවර්ධන කාර්යයන් මෙහෙයවීම හා ඇගයීම සහ පළාත් අතර හා පළාත් තුළ පවත්නා විෂමතාවයන් සාධාරණ අයුරින් අඩුකරලීම සඳහා උචිත නිර්දේශ රජයට සැපයීම.

### 2.3 ප්‍රමුඛ පරාසයන්

- පළාත් අතර මූල්‍ය සම්පත් වෙන් කිරීමට අදාල මූලධර්ම සැකසීම හා ඒ පිළිබඳව දැනුවත් කිරීම.
- පළාත් අතර සම්පත් සාධාරණ අයුරින් බෙදී යෑම සහතික කරලීම.
- ප්‍රාදේශීය විෂමතා අඩු කරලීම හා මානව සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.
- පළාත් තුළ සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝජනයට ගැනීම සහතික කරලීම.
- පළාත් හා ප්‍රාදේශීය මට්ටමෙන් ආදායම් උත්පාදනය පුළුල් කිරීම.
- පළාත් හා ප්‍රාදේශීය මට්ටමේ ආයතනික සංවර්ධනය ශක්තිමත් කිරීම.

- රජය හා පළාත් අතර කාර්යක්ෂම වූ සම්බන්ධීකරණයක් ඇති කරලීම.
- රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය මගින් ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය.
- මුදල් කොමිෂන් සභාවේ මානව හා ආයතනික ධාරිතාව වැඩිදියුණු කිරීම.

## 3. ආයතනික ව්‍යුහය සහ කාර්ය මණ්ඩල තොරතුරු

### 3.1 මුදල් කොමිෂන් සභාවේ ව්‍යුහය

මුදල් කොමිෂන් සභාව සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර, එයින් දෙදෙනෙකු නිල බලයෙන් පත්වේ. එනම්, මහ බැංකුවේ අධිපතිවරයා සහ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා ය.අනෙක් සාමාජිකයින් තිදෙනා පත් කෙරෙනුයේ ප්‍රධාන ජනවර්ග තුන නියෝජනය වන පරිදිය. 2014 වර්ෂය තුළ මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින් වූයේ ආරියරත්න හේවගේ මහතා (සභාපති),එම්.එන්.ජුනයිඩ් මහතා, සී.පී.ර්.ගුණසිංහම් මහතා අභාවප්‍රාප්ත වූයෙන් ඒ වෙනුවෙට එස්.අමිත්තලිංගම් මහතා, ආචාර්ය පී.බී.ජයසුන්දර මහතා (නිල බලයෙන් සාමාජික) හා අජිත් නිවාඩ් කබ්රාල් මහතා (නිල බලයෙන් සාමාජික) යන මහත්වරුන්ය.

### 3.2 මුදල් කොමිෂන් සභා ලේකම් කාර්යාලය

මුදල් කොමිෂන් සභා ලේකම් කාර්යාලය ''ඒ'' ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ක්‍රියාත්මක වේ. ප්‍රධාන විධායක නිලධාරිවරයෙකු (ලේකම්) යටතේ මෙම ලේකම් කාර්යාලය පාලනය වන අතර, ඔහුගේ සහායට නිලධාරි මණ්ඩලයක් සිටී. ඒ තුළට අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, අභ්‍යන්තර විගණන නිලධාරි, ගණකාධිකාරි, සහකාර අධ්‍යක්ෂවරුන්, පරිපාලන නිලධාරි, සහකාර පර්යේෂණ නිලධාරීන්, වැඩසටහන් සහකාරවරුන්, කළමනාකරණ සහායකයින් සහ සුළු සේවක පිරිස් අයත් වේ.

### 3.3 2014.12.31 දිනට කාර්ය මණ්ඩලය


| අනු අංකය | තනතුර | අදාල වන සේවය | පන්තිය / ශ්‍රේණිය | වැටුප් කේතය (රා.පරි.ච.ලේ. 6/2006 අනුව) | අනුමත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | ලේකම් | - | - | SL 3-2006 | 01 |
| 02 | අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවය | I | SL 1-2006 | 01 |
| 03 | අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | I | SL 1-2006 | 02 |
| 04 | අධ්‍යක්ෂ | දෙපාර්තමේන්තුගත | I | SL 1-2006 | 01* |
| 05 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවය | III/II | SL 1-2006 | 02 |
| 06 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | III/II | SL 1-2006 | 05 |
| 07 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | දෙපාර්තමේන්තුගත | III/II | SL 1-2006 | 02* |
| 08 | ගණකාධිකාරි | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය | III/II | SL 1-2006 | 01 |
| 09 | අභ්‍යන්තර විගණක | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය | III/II | SL 1-2006 | 01 |
| 10 | පරිපාලන නිලධාරි | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | අධි පන්තිය | MN 7-2006 A | 01 |
| 11 | තොරතුරු හා සනින්වේදන තාක්ෂණ නිලධාරි | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 2-II/1 | MN 6-2006 A | 01 |
| 12 | සංඛ්‍යා ලේඛන නිලධාරි | දෙපාර්තමේන්තුගත | III/II/I | MN 5-2006 A | 01◆ |
| 13 | අයවැය සහකාර | ආශ්‍රිත සේවා | - | MN 4-2006 A | 02 |
| 14 | පර්යේෂණ නිලධාරි | ආශ්‍රිත සේවා | - | MN 4-2006 A | 10• |
| 15 | සහකාර පර්යේෂණ නිලධාරි | ආශ්‍රිත සේවා | - | MN 4-2006 A | 09• |
| 16 | වැඩසටහන් සහකාර | ආශ්‍රිත සේවා | - | MN 4-2006 A | 05• |
| 17 | වැඩසටහන් නිලධාරි | ආශ්‍රිත සේවා | - | MN 4-2006 A | 05• |
| 18 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | III/II/I | MN 2-2006 A | 13 |
| 19 | 2015 අයවැය යෝජනා අනුව රා.පරි.චක්‍ර. 25/2014 අනුව කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන | දෙපාර්තමේන්තුගත | | MN 1 | 02 |
| 20 | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | III/II/I | PL 3-2006 A | 08 |
| 21 | කාර්යාල කාර්ය සහායක | කාර්යාල සේවක සේවය | III/II/I | PL 1-2006 A | 05 |
| **අනුමත මුළු තනතුරු සංඛ්‍යාව** | | | | | **78** |

* මෙම තනතුර III/II/I ශ්‍රේණි ඒකාබද්ධ කරන ලද දෙපාර්තමේන්තුගත තනතුරකි. ඒ අනුව, නිලධාරියා ශ්‍රේණි උසස්වීම් ලබන විට පමණක් එම ශ්‍රේණියට අදාල තනතුරු නාමය භාවිතා කිරීමට හිමිකම් ලබයි. අදාල නිලධාරියා ස්ථිර පදනමින් උසස් කරන ලද ශ්‍රේණියට වඩා ඉහළ ශ්‍රේණියකට අදාල තනතුරක වැඩ බැලීමේ පදනමින් කටයුතු කිරීමට පත් නොකළ යුතුය. මෙම තනතුර සඳහා විධිමත් පරිදි බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කරවා ගත යුතු වේ.

◆ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කරගත යුතු වේ.

• ආශ්‍රිත සේවයට අයත් නිලධාරීන් ඉදිරියේ දී සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කිරීමට යටත් විය යුතු වේ.

**3.4 කාර්ය මණ්ඩල සටහන**



## 4. මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධනය - 2014

මුදල් කොමිෂන් සභාවට පැවරී ඇති මූලික කාර්යය වනුයේ රට තුළ තුලිත සංවර්ධනයක් සහතික වන පරිදි පළාත් අතර අරමුදල් වෙන් කිරීම හා ඒවා ඵලදායී ලෙස භාවිතයට ගැනීම තහවුරු කරනු පිණිස අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම හා තාක්ෂණික සහය ලබා දීමයි. මෙහිලා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සිදු කරනු ලබන්නේ සභාපතිගේ මූලිකත්වයෙන් යුත් කොමිෂම විසින් වේ. 2014 වර්ෂය තුළ දී කොමිෂන් සභාව සිව් වරක් රැස් වී ඇත.

කාර්යමය අවශ්‍යතාවයන්ට අනුව පහත දැක්වෙන පරිදි මුදල් කොමිෂන් සභාව අංශ හයකට බෙදා ඇත.

1. ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය
2. ප්‍රතිඵල පාදක සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අංශය
3. අයවැය හා පුරෝකථන අංශය
4. අධීක්ෂණ හා ඇගයීම් අංශය
5. පරිපාලන අංශය
6. මූල්‍ය අංශය

මුදල් කොමිෂන් සභාවට ව්‍යවස්ථාවෙන් පැවරී ඇති වගකීම්වලට අදාල කාර්යයන් ඉටු කිරීම, ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය, ප්‍රතිඵල පාදක සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අංශය, අයවැය හා පුරෝකථන අංශය හා අධීක්ෂණ හා ඇගයීම් අංශය මගින් සිදු කරනු ලබන අතර, පරිපාලන හා මූල්‍ය අංශයන් විසින් අවශ්‍ය සහාය සේවාවන් සිදු කරනු ලබයි.

### 4.1 ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය

2015 වර්ෂය වෙනුවෙන් පළාත් වෙත ලබා දීමට නිර්දේශිත ප්‍රතිපාදන හා එම ප්‍රතිපාදන පළාත් අතර බෙදා හරිනු ලබන ආකාරය හා එයට අදාල ප්‍රතිපත්ති අන්තර්ගත නිර්දේශය 2014 වර්ෂයේදී පිළියෙල කර අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී. අනතුරුව එතුමා විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

2014 වර්ෂයේදී මුදල් කොමිෂන් සභාව විසින් පළාත් වෙත නිකුත් කරන ලද "මූල්‍ය අවශ්‍යතා ඉල්ලුම් කිරීමේ මාර්ගෝපදේශ" අනුව පළාත් අධිකාරීන් විසින් 2015 වර්ෂය සඳහා වූ ප්‍රාග්ධන මූල්‍ය අවශ්‍යතා ඉල්ලීම් මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. මුදල් කොමිෂන් සභාව විසින් මෙම ඉල්ලීම් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව තක්සේරු කරන ලද ප්‍රාග්ධන වියදම් අවශ්‍යතාවය, මහා භාණ්ඩාගාරය වෙත නිර්දේශ කරන ලදී. මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ පදනම් කරගෙන මහා භාණ්ඩාගාරය විසින් 2015 වර්ෂය සඳහා පළාත් සභාවලට වෙන් කරනු ලැබූ ප්‍රාග්ධන ප්‍රතිපාදන පළාත් අතර බෙදා වෙන් කිරීම 2014 සැප්තැම්බර් මාසය තුළ දී සිදු කරන ලදී. පළාත් අතර ප්‍රග්ධන අරමුදල් වෙන් කිරීමේ දී

සංඛ්‍යානමය ක්‍රමවේදයක් භාවිත කරන ලද අතර, එහිදී ජනතාවගේ සමාජ-ආර්ථික දියුණුව කෙරෙහි සමීප ලෙස බලපාන විචල්‍යයන් කිහිපයක් සැලකිල්ලට ගෙන ඇත. ඒවා අතර පළාත් ඒක පුද්ගල ආදායම, දරිද්‍රතා අනුපාතය, විරැකියා අනුපාතය, ළමා හා මාතෘ මරණ අනුපාත, පාසල්වලට ඇතුළත් වීමේ අනුපාතය, පාසල් සිසුන්ගේ ඉගෙනුම් සාධනය, නිවාසවල ගුණාත්මකභාවය සහ පළාත් මාර්ග පද්ධතිය වැනි දෑ ප්‍රධාන වේ. ඒ අනුව, 2015 වර්ෂය සඳහා එක් එක් පළාතට ලබා දුන් ප්‍රාග්ධන අරමුදල් පහත දැක්වේ.

*රු.මි.*

| **පළාත** | **පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන** | **සංවර්ධන ව්‍යාපෘති** | **උපමාන පාදක ප්‍රදාන** |
|---|---:|---:|---:|
| බස්නාහිර | 1,452 | 1,145.91 | 525 |
| මධ්‍යම | 1,390 | 2,489.35 | 500 |
| දකුණ | 1,305 | 2,691.80 | 385 |
| උතුරු | 1,440 | 3,597.80 | 400 |
| නැගෙනහිර | 1,190 | 1,279.32 | 400 |
| වයඹ | 1,325 | 1,174.77 | 425 |
| උතුරු මැද | 1,190 | 1,040.10 | 375 |
| ඌව | 1,350 | 2,011.17 | 375 |
| සබරගමුව | 1,365 | 2,995.10 | 400 |
| **එකතුව** | **12,007** | **18,425.32** | **3,785** |

මෙසේ වෙන් කළ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන එක් එක් විෂයයන්/ අංශ අතර බෙදා වෙන් කිරීම සඳහා අතීත කාර්යසාධනය, ආයතනික ධාරිතාවය, විදේශාධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති, රජයේ සංවර්ධන ප්‍රමුඛතා සහ පවත්නා සම්පත් ප්‍රමාණය වැනි කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී. ඒ අනුව, 2015 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන එක් එක් විෂයයන්/ අංශ අතර බෙදා වෙන් කරන ලද ආකාරය ඇමුණුම 1 හි දැක්වේ.

2015 වර්ෂයේදී පළාත්වලට වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන ඵලදායී ලෙස මහජන සුභසිද්ධිය උදෙසා ආයෝජනය කිරීමට අවශ්‍ය මගපෙන්වීම ලබා දීම පිණිස මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර 2014 සැප්තැම්බර් මස පළාත් සභාවලට යවන ලදී. 2015 වර්ෂයේ සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී එම මාර්ගෝපදේශ අනුගමනය කිරීම පළාත්වලින් අපේක්ෂා කෙරේ.

තවද, මුදල් කොමිෂන් සභාවේ 2012 වාර්ෂික වාර්තාව මුද්‍රණය කර අදාල පාර්ශවයන් අතර බෙදා හැරීමට කටයුතු කරන ලදී.

**4.2 ප්‍රතිඵල පාදක සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අංශය**

මෙම අංශය විසින් පහත දැක්වෙන කාර්යයන් 2014 වර්ෂය තුළ ඉටු කර ඇත.

1. පළාත්වල 2014 වාර්ෂික සංවර්ධන සැලසුම්වලට මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා දීම.

2. පළාත්වල 2014 වාර්ෂික සංවර්ධන සැලසුම් තුළ පළාත් විසින් අපේක්ෂා කරනු ලබන සංශෝධන සඳහා එකඟතාවය ලබා දීම.

3. මුදල් කොමිෂන් සභාව විසින් ජනාධිපතිතුමා වෙත යවනු ලබන 2015 වර්ෂයේ නිර්දේශ සකස් කිරීම සඳහා දායක වීම.

මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන් සහ මධ්‍යම පළාත් සභාවේ නිලධාරීන් විසින් 2014.08.21 හා 22 දෙදින මාතලේ හා නුවරඑළිය යන දිස්ත්‍රික්කවල කෘෂිකර්මය සහ පශු සම්පත් යන අංශවලට අයත් වගා බිම් හා ගොවිපළවල් නිරීක්ෂණය කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක නිරත විය. මෙහිදී, බීජ ලොකු ළූණු හා බීජ අර්තාපල් නිෂ්පාදනය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන ලදී. මෙම ක්ෂේත්‍ර චාරිකාවෙන් ලද අත්දැකීම් මත පදනම්ව බීජ ලොකු ළූණු, බීජ අර්තාපල් හා බීජ බෝංචි නිපදවනු ලබන ව්‍යවසායක ගොවීන් සඳහා විශේෂ සහනදායී ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලෙසට මුදල් කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලීමක් කරන ලදී.

**4.3 අයවැය හා පුරෝකථන අංශය**

පළාත්වල පුනරාවර්තන මූල්‍ය අවශ්‍යතාවයන් තක්සේරු කිරීමෙන් අනතුරුව වාර්ෂික අයවැයෙන් අදාල වෙන් කිරීම් සිදු කිරීම පිණිස මහා භාණ්ඩාගාරය වෙත එම මූල්‍ය අවශ්‍යතාවයන් නිර්දේශ කිරීම හා පළාත්වල පුනරාවර්තන වියදම් සඳහා ලබා දෙන සාමූහික ප්‍රතිපාදන පළාත් අතර බෙදා වෙන් කිරීම මෙම අංශයේ මූලික කාර්යය වේ.

2014 වර්ෂයේ දී මුදල් කොමිෂන් සභාව විසින් පළාත් වෙත නිකුත් කරන ලද මාර්ගෝපදේශ හා ආකෘති පත්‍ර අනුව පළාත් අධිකාරීන් විසින් 2015 වර්ෂය සඳහා වූ පුනරාවර්තන මූල්‍ය අවශ්‍යතා ඉල්ලීම් මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. මෙම ඉල්ලීම් තක්සේරු කිරීමෙන් අනතුරුව ඇස්තමේන්තු කරන ලද පුනරාවර්තන මූල්‍ය අවශ්‍යතාවයෙන් මුදල් කොමිෂන් සභාව විසින් පළාත් වෙත ලබා දෙන ආදායම් ඉලක්ක අඩු කිරීමෙන් පසු සැබෑ පුනරාවර්තන වියදම් අවශ්‍යතාවය හෙවත් සාමූහික ප්‍රදාන මහා භාණ්ඩාගාරය වෙත නිර්දේශ කරන ලදී.

මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ පදනම් කරගෙන මහා භාණ්ඩාගාරය විසින් 2015 වර්ෂය වෙනුවෙන් පළාත්වලට වෙන් කරනු ලැබූ සාමූහික ප්‍රදාන පහත පරිදි වේ.

| පළාත | සාමූහික ප්‍රදාන (රු.මි.) |
|---|---:|
| බස්නාහිර | 42,450 |
| මධ්‍යම | 23,834 |
| දකුණු | 21,781 |
| උතුරු | 15,123 |
| වයඹ | 23,105 |
| උතුරුමැද | 13,544 |
| ඌව | 15,241 |
| සබරගමුව | 18,038 |
| නැගෙනහිර | 16,484 |
| **එකතුව** | **189,600** |

### 4.4 අධීක්ෂණ හා ඇගයීම් අංශය

ප්‍රතිඵල පාදක කළමනාකරණ ප්‍රවේශයට අනුව පළාත්වල සංවර්ධන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ප්‍රතිපත්ති මට්ටමේ හා ක්‍රියාත්මක මට්ටමේදී අධීක්ෂණ කිරීම සඳහා පළාත් නිලධාරීන්හට අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කරන ලදී.

මුදල් කොමිෂන් සභාවේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම පිණිස කටයුතු කරන ලදී.

### 4.5 පරිපාලන අංශය

***(අ) පෞද්ගලික ලිපිගොනු හා අනෙකුත් ලිපි ලේඛන ක්‍රමානුකූලව පවත්වාගෙන යෑම ඇතුළුව පිරිස් කළමනාකරණය***

අදාල වාර්ෂික වැටුප් වර්ධක සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ගෙවීම් සිදු කරන ලදී. නිලධාරීන් විසින් සිදු කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගෙන සේවා සහතික නිකුත් කරන ලදී.

***(ආ) බිල්පත් නිරවුල් කිරීම***

මුදල් කොමිෂන් සභාවේ ගෙවීම්වලට අදාල වවුචර්පත් සකස් කර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ගෙවීම් කටයුතු සඳහා ගිණුම් අංශයට ඉදිරිපත් කරන ලදී. ගිණුම් අංශයෙන් චෙක්පත් සැකසීම අවසන් කළ පසු අදාල ආයතන හා පුද්ගලයින්ට එකී චෙක්පත් නියමිත දිනට යැවීමට කටයුතු කරන ලදී. මෙම සියලු ගෙවීම්වලට අදාල ලිපි ලේඛන මැනවින් පවත්වාගෙන ගොස් ඇත.

***(ඇ) ආරක්ෂක හා සනීපාරක්ෂක සේවාවන් අධීක්ෂණය කිරීම***

සේවා ගිවිසුම් ප්‍රකාරව සේවාවන් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව මාසිකව බිල්පත් පරීක්ෂා කර, වවුචර්පත් සකසා නිර්දේශ කර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමෙන් පසුව ගෙවීම් කටයුතු සඳහා ගිණුම් අංශයට ඉදිරිපත් කරන ලදී.

*(ඇ) කාර්යාල පරිශ්‍රය හා අනෙකුත් වත්කම් නිසි අයුරින් පවත්වාගෙන යාම*

කාර්යාල ගොඩනැගිල්ල මාසිකව කුලී ගෙවීමේ පදනම මත ලබාගෙන ඇති අතර, නඩත්තු කටයුතු කාර්යාලය මගින් ද අනෙකුත් නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු ගොඩනැගිල්ලෙහි හිමිකරු මගින් ද සිදු කරන ලදී. එමෙන්ම, වාහන, පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර හා ෆැක්ස් යන්ත්‍ර ආදී වත්කම්වල නඩත්තු හා අලුත්වැඩියා කටයුතු සේවා ගිවිසුම් ප්‍රකාරව සිදු කරන ලදී.

*(ඉ) නිවාඩු, ණය හා වැටුප් වර්ධක වැනි විෂයයනට අදාල දෛනික පරිපාලන කටයුතු*

නිවාඩු ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් වූ විගස ඒවා නිවාඩු ලේඛනයේ සටහන් කරන ලද අතර, මාසිකව ඇඟිලි සලකුණු යන්ත්‍රයෙන් වාර්තා ලබාගෙන ඒ අනුව නිවාඩු ලේඛනය යථාවත් කරන ලදී. රාජකාරි නිවාඩු, කෙටි නිවාඩු හා රාජකාරි සඳහා බැහැරයාම සම්බන්ධ ලේඛන නඩත්තු කරන ලද අතර, මෙම නිවාඩු සම්බන්ධව පරිගණක වාර්තාවෙහි ද සටහන් තබා ඇත. එමෙන්ම, අනුමත ප්‍රමාද වීම් සඳහා දෙනු ලබන සහන, පරිගණක සටහන් පත්‍රිකාවෙහි සටහන් කරන ලදී.

*(ඊ) භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය*

පවිත්‍රතා සේවාව සහ ආරක්ෂක සේවාව සඳහා ආයතන කිහිපයකින් මිල ගණන් කැඳවන ලද අතර, එම සේවාවන් සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ විෂන් කෙයාර් (පුද්) ආයතනය හා ඩබ්ලිව්.ඊ.ආරක්ෂක සේවා ආයතනය සමග ගිවිසුම්වලට එළඹ එකී සේවා කටයුතු භාරදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

*(උ) පුහුණු හා සංවර්ධන කටයුතු පහසු කරලීම*

2014 වර්ෂය සඳහා පහත දැක්වෙන දේශීය පාඨමාලා වෙනුවෙන් පහත දැක්වෙන නිලධාරීන් සහභාගි කරවීම සිදු කරන ලදී.

**<u>දේශීය පුහුණු පාඨමාලා</u>**

| | නම | තනතුර | පාඨමාලාව | ආයතනය | දිනය |
|---|---|---|---|---|---|
| 01 | කේ.එච්.ජී.එරංග නයනජිත් මයා | කා.සේ.සේ. III | දෙමළ භාෂා පාඨමාලාව | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 2014.01.07 දින සිට මාස 06 (සතියට දින 01 බැගින්) |
| 02 | එස්.කේ.ගාමින්ද කොඩිකාර මයා | සහකාර පර්යේෂණ නිලධාරි | ඉංග්‍රීසි පාඨමාලාව | බ්‍රිටිෂ් කවුන්සිල් ආයතනය | 2014.01.22 - 2014.03.28 |
| 03 | යූ.පී.විජයහේවා මිය | ගණකාධිකාරි | ඉංග්‍රීසි පාඨමාලාව | බ්‍රිටිෂ් කවුන්සිල් ආයතනය | 2014.01.22 - 2014.03.28 |
| 04 | එම්.එල්.ඒ.චන්ද්‍රදාස මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.බ.) | ඉංග්‍රීසි පාඨමාලාව | බ්‍රිටිෂ් කවුන්සිල් ආයතනය | 2014.01.22 - 2014.03.28 |
| 05 | රේණුකා නිශාන්ති පෙරේරා මිය | වැඩසටහන් සහකාර | ඉංග්‍රීසි පාඨමාලාව | බ්‍රිටිෂ් කවුන්සිල් ආයතනය | 2014.01.25 - 2014.03.29 |
| 06 | ඒ.පී.එස්.පී.සමරතුංග මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර I | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2014.07.17 - 2014.07.18 |
| 07 | පී.ගමගේ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර I | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2014.07.24 - 2014.07.25 |
| 08 | කේ.එච්.ජී.එරංග නයනජිත් මයා | කා.සේ.සේ. III | විදුලි තාක්ෂණ ශිල්පය | ජනාවාස සැලසුම් හා සංවර්ධන මධ්‍යස්ථානය, බත්තරමුල්ල. | 2014.08.19 |
| 09 | ඒ.ඩබ්.රවීන්ද්‍ර ජගත් කුමාර මයා | කා.සේ.සේ. III | විදුලි තාක්ෂණ ශිල්පය | ජනාවාස සැලසුම් හා සංවර්ධන මධ්‍යස්ථානය, බත්තරමුල්ල. | 2014.08.19 |
| 10 | ඊ.එච්.එම්.දිනුෂා හේරත් මිය | වැඩසටහන් නිලධාරි | දෙමළ භාෂා පුහුණුව | බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාව | 2014.11.21 සිට දින 12 |
| 11 | ඩබ්.ජී.වසන්ත කුමාර මයා | රියදුරු | දෙමළ භාෂා පුහුණුව | බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාව | 2014.11.21 සිට දින 12 |
| 12 | යූ.පී.විජයහේවා මිය | ගණකාධිකාරි | දෙමළ භාෂා පුහුණුව | බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාව | 2014.11.21 සිට දින 12 |
| 13 | කේ.එච්.ජී.එරංග නයනජිත් මයා | කා.සේ.සේ. III | දෙමළ භාෂා පුහුණුව | බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාව | 2014.11.21 සිට දින 12 |

## 4.6 මූල්‍ය අංශය

මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන ව්‍යවස්ථාපිත සහ අනෙකුත් කාර්යයන් නිසි පරිදි පවත්වාගෙන යනු පිණිස මූල්‍ය අංශය මගින් පහසුකම් සලසනු ලැබේ. තවද, මහා භාණ්ඩාගාරය සමග නිසි සම්බන්ධතාවයක් පවත්වාගෙන යමින් වාර්ෂික මූල්‍ය අවශ්‍යතාවයනට සරිලන පරිදි අරමුදල් සපයා ගැනීමත්, එම අරමුදල් නිසි ලෙස කළමනාකරණය කිරීමත් සිදු කරනු ඇත.

2014 වර්ෂයේ දී අයවැය මගින් මුදල් කොමිෂන් සභාව වෙත පුනරාවර්තන වියදම් ලෙස රු.36,625,000/- ක්ද, ප්‍රාග්ධන වියදම් ලෙස රු.4,100,000/- ක්ද වෙන් කර තිබුණි.

පුනරාවර්තන වියදම්වල මූල්‍යමය උපයෝගිතාවය 90% ක් වැනි මට්ටමක පැවති අතර, ප්‍රාග්ධන වියදම්වල සමස්ත මූල්‍ය උපයෝජනය 41% ක පමණ අඩු මට්ටමක පැවතුණි. ආයතනය තුළ පැවති යන්ත්‍රෝපකරණ හා ලී බඩු බොහොමයක් ඉතා ආසන්න කාල වකවානුවල මිලට ගත් ඒවා වූ බැවින්, නව මිලදී ගැනීම් සිදු නොවීම එයට මූලික හේතුව විය.

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 33/2013 ට අනුකූලව නියමිත දිනයන්ට පෙර විසර්ජන ගිණුම් ඇතුළු අනෙකුත් ගිණුම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. 2014 වර්ෂයට අදාලව මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රතිපාදන, වියදම හා එහි මූල්‍ය කාර්යසාධනය පහතින් විස්තර කර ඇත.

**<u>මූල්‍ය ප්‍රතිපාදන, වියදම් හා මූල්‍ය ප්‍රගතිය - 2014</u>**

| විෂය අංකය | විස්තරය | ප්‍රතිපාදන | වියදම | මූල්‍ය කාර්ය සාධනය |
|---|---|---|---|---|
| | **පුනරාවර්තන ප්‍රතිපාදන / වියදම** | රු. | රු. | |
| | පුද්ගල පඩිනඩි | 19,250,000.00 | 17,781,434.75 | 92% |
| | අනෙකුත් පුනරාවර්තන වියදම් | 17,375,000.00 | 15,210,776.41 | 87% |
| | **එකතුව** | **36,625,000.00** | **32,992,211.16** | **90%** |
| | **ප්‍රාග්ධන ප්‍රතිපාදන / වියදම** | | | |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000.00 | 37,730.00 | 6% |
| 2003 | රථ වාහන | 400,000.00 | 0.00 | 0% |
| 2102 | ලී බඩු සහ කාර්යාල උපකරණ | 1,200,000.00 | 1,037,577.40 | 86% |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,000,000.00 | 337,980.00 | 34% |
| 2401 | පුහුණු හා ධාරිතා වර්ධනය | 1,000,000.00 | 294,670.00 | 29% |
| | **එකතුව** | **4,100,000.00** | **1,700,957.40** | **41%** |
| | **මුළු එකතුව** | **40,725,000.00** | **34,693,168.56** | **85%** |

අත්තිකාරම් ගිණුම් කටයුතු

රු.

| විස්තරය | වියදම් උපරිම සීමාව | ලැබීම් උපරිම සීමාව | හර ශේෂයේ උපරිම සීමාව |
|---|---|---|---|
| ප්‍රතිපාදන | 3,500,000.00 | 1,000,000.00 | 20,000,000.00 |
| සත්‍ය (FR 505 (1)) යටතේ ගැලපීම් සිදු කිරීමෙන් පසු | 2,053,763.00 | 1,619,437.00 | 7,160,488.00 |

## 5. පොදු පරිපාලනය

### 5.1 2014 වර්ෂයේ කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| සභාපති | ආරියරත්න හේවගේ මයා |
| ලේකම් | ඩබ්.එච්.මුණසිංහ මයා |
| ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ | පී.සුමනපාල මයා |
| අධ්‍යක්ෂ | ඒ.ටී.එම්.යූ.ඩී.බී.තෙන්නකෝන් මයා |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | එම්.එල්.ඒ.චන්ද්‍රදාස මයා |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) | යූ.පී.විජයහේවා මිය |
| පරිපාලන නිලධාරි | ඩබ්.එස්.මංගලිකා මිය |
| සංඛ්‍යාලේඛන නිලධාරි | කුමුදිනී කෞශල්‍යා ද අල්මේදා මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | ටී.එම්.සී.කුමාරිහාමි මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | පී.ඉන්ද්‍රාදේවි මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | කේ.එස්.ඩී.නිලන්ති මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | එස්.කේ.කේ.ගාමින්ද මයා |
| සහකාර පර්යේෂණ නිලධාරි | ආර්.ආර්.රණසිංහ මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | එච්.එච්.ප්‍රියන්ත මයා |
| සහකාර පර්යේෂණ නිලධාරි | එම්.සී.දමයන්ති මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | ඒ.ආර්.මරීනා මෙය |
| සහකාර පර්යේෂණ නිලධාරි | එස්.වයි.දිසානායක මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | ඩබ්.පී.සී.ආර්.පී.හන්ගම්පෝරුව මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | එම්.බී.එම්.ඒ.එච්.බණ්ඩාර මයා |
| සහකාර පර්යේෂණ නිලධාරි | ඩී.ඩී.ජේ.කුමාරි මිය |
| වැඩසටහන් සහකාර | පී.ඒ.එස්.ප්‍රියදර්ශනී මෙය |
| වැඩසටහන් සහකාර | එස්.බී.සමරසේකර මිය |
| කළමනාකරණ සහකාර | ඊ.ඒ.එල්.ඉලේපෙරුම මයා |
| කළමනාකරණ සහකාර | ඒ.පී.එස්.පී.සමරතුංග මිය |
| කළමනාකරණ සහකාර | පී.ගමගේ මිය |
| කළමනාකරණ සහකාර | ඩී.කේ.ඩි.කන්නන්ගර මයා |
| කළමනාකරණ සහකාර | ඩී.ටී.කේ.පෙරේරා මිය |
| කළමනාකරණ සහකාර | එම්.ඒ.එෆ්.රිෆ්නා මෙය |

| | |
|---|---|
| රියදුරු | උපාලි සෙනෙවිරත්න මයා |
| රියදුරු | එම්.කේ.ආර්.ප්‍රීමාල් මයා |
| රියදුරු | බී.පී.ජී.ඒ.දයානන්ද මයා |
| කා.සේ.සේ | ටී.ජයමිණි මයා |
| කා.සේ.සේ | කේ.එච්.ජී.එරංග නයනජිත් මයා |
| කා.සේ.සේ | ඒ.ඩබ්.රවීන්ද්‍ර ජගත් කුමාර මයා |
| තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණිය (කොන්ත්‍රාත්) | පී.ඩී.තිළිණ ප්‍රමෝද් විජේවර්ධන මයා |
| කළමනාකරණ සහකාර MN 1 (දෙපාර්තමේන්තුගත) | සී.ඩී.ආටිගල මිය |
| කළමනාකරණ සහකාර MN 1 (දෙපාර්තමේන්තුගත) | ආර්.ඒ.නිශානි මධූකා රණසිංහ මෙය |
| කාර්යාල සේවක සේවය (අනියම්) | ජී.ඉසුරි අයේෂා සඳරේණු මෙය |
| කාර්යාල සේවක සේවය (අනියම්) | ඩබ්.ඒ.සොනාලි දිලිනි ඉරේෂා මෙය |

## 5.2 මුදල් කොමිෂන් සභාවෙන් මාරු කරන ලද නිලධාරීන් - 2014

| | | | | |
|---|---|---|---|---|
| සහකාරපර්යේෂණ නිලධාරි | - | අයි.වී.එල්.අයි.ලිලන්ති මිය | - | 2014.04.15 |
| සහකාරපර්යේෂණ නිලධාරි | - | එස්.වීරතුංග මිය | - | 2014.04.15 |
| සහකාරපර්යේෂණ නිලධාරි | - | එන්.රත්නායක මයා | - | 2014.06.06 |
| සහකාරපර්යේෂණ නිලධාරි | - | ඩබ්.පී.ඒ.විජයසූරිය මයා | - | 2014.06.06 |
| වැඩසටහන් සහකාර | - | ඩබ්.ආර්.එන්.පෙරේරා මිය | - | 2014.10.20 |

## 5.3 මුදල් කොමිෂන් සභාවට කරන ලද නව පත්වීම් - 2014

| | |
|---|---|
| කළමනාකරණ සහකාර MN 1 (දෙපාර්තමේන්තුගත) | සී.ඩී.ආටිගල මිය |
| කළමනාකරණ සහකාර MN 1 (දෙපාර්තමේන්තුගත) | ආර්.ඒ.නිශානි මධූකා රණසිංහ මෙය |

## 6. මධ්‍ය කාලීනව කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා යෝජිත උපායමාර්ග

පළාත් සැලසුම්කරණය හා අයවැය ක්‍රියාවලිය සම්බන්ධයෙන් හඳුන්වාදෙන ලද නව ප්‍රවේශයන්ට සරිලන පරිදි මුදල් කොමිෂන් සභාවේ සියලුම නිලධාරීන්ගේ දැනුම හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් නවතාවයකට පත් කළ යුතුව ඇත. තවද, කාර්යමණ්ඩලයේ සහ ආයතනයේ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තරික වශයෙන් ක්‍රියාමාර්ග රැසක් ගැනීමට සිදු වේ. මෙම සියලු ක්‍රියාමාර්ග සැකෙවින් පහත දැක්වේ.

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය, වගකීම් සහ බලතල පැහැදිලිව නිශ්චිත කෙරෙන මුදල් කොමිෂන් සභා පනත සකස් කර පාර්ලිමේන්තුවෙන් සම්මත කරගැනීමට ක්‍රියා කිරීම.

(ii) මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය මැනවින් ඉටු කරගත හැකි පරිදි ආයතනික ව්‍යුහය හා කාර්යමණ්ඩලය සංශෝධනය කිරීමට පියවර ගැනීම. මෙහිදී, සැලසුම්කරණය, ව්‍යාපෘති ඇගයීම, මූල්‍යකරණය, නීති කටයුතු වැනි ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නව තනතුරු ඇති කිරීමට අත්‍යවශ්‍ය කරුණක් ලෙස පෙන්වා දිය හැකිය.

(iii) මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා නව සැලසුම් ක්‍රමවේද හා කළමනාකරණ විධි ආවරණය වන පරිදි අවශ්‍ය පුහුණුවීම් ලබාදීම ඔවුන්ගේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා අත්‍යවශ්‍ය කරුණක් වනු ඇත.

(iv) මුදල් කොමිෂන් සභාව විසින් ස්වකීය කාර්යභාරය ඉටුකිරීමේ දී සිංහල / ඉංග්‍රීසි හා දෙමළ භාෂා තුනෙන්ම කටයුතු කිරීමට සිදුවන හෙයින් සියලුම නිලධාරීන්ට එම භාෂාව පිළිබඳව විශේෂ පුහුණුවක් ලබාදීම අවශ්‍ය කෙරේ. විශේෂයෙන්ම දෙමළ භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් ඇති නිලධාරියෙකු බඳවා ගැනීම අවශ්‍ය වේ.

(v) කාර්යාල කළමනාකරණය හා නව කළමනාකරණ විධි පිළිබඳව අවශ්‍ය දැනුවත්භාවය ලබාදීම සඳහා පරිපාලන හා ගිණුම් අංශයට අදාල නිලධාරීන් යොමු කළ යුතුය.

(vi) මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන්ට වැඩකටයුතු කරගෙන යාමේ දී පරිගණක තාක්ෂණික දැනුම අත්‍යවශ්‍ය වන බැවින්, නව පැකේජයන් හා විද්‍යුත් තැපැල භාවිතා කිරීම පිළිබඳ මනා පුහුණුවක් ලබාදීම අවශ්‍ය කෙරේ. මෙහිදී, තොරතුරු තාක්ෂණ ආයතන, විශ්වවිද්‍යාල හා ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතන සමග සමීප සම්බන්ධතාවයකින් කටයුතු කිරීම අවශ්‍ය වේ.

## 7. විගණන වාර්තාව

2014 වර්ෂය සඳහා විගණන විමසුම් හතරක් (04) ලැබී තිබුණි. 2014 වර්ෂයට අදාල ප්‍රසිද්ධ කරන ලද අවසාන විගණන වාර්තාව මෙතෙක් ලැබී නොමැති අතර, විගණකාධිපතිගේ කෙටුම්පත් විගණන වාර්තාව අනුව, 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත්පත් අනුව මුදල් කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන කළමනාකරණ විගණන වාර්තාවේ නිරීක්ෂණවලට යටත්ව සමස්තයක් ලෙස සතුටුදායක ලෙස පිළියෙල කර තිබූ බව විගණකාධිපති විසින් දන්වා තිබුණි.

ඇමුණුම 1

# වෙන් කිරීම් - 2015

## පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන

රු.මි.

| අනු අංකය | ආයතනය/ අංශය | බස්නාහිර | මධ්‍යම | දකුණු | උතුරු | නැගෙනහිර | වයඹ | උතුරු මැද | ඌව | සබරගමුව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1** | **සමාජ යටිතල පහසුකම්** | **486** | **467** | **454** | **675** | **521** | **471** | **422** | **504** | **512** | **4,512** |
| 1.1 | අධ්‍යාපන සේවා | | | | | | | | | | |
| | 1.1.1. අධ්‍යාපනය | 207 | 196 | 176 | 273 | 203 | 207 | 179 | 224 | 221 | 1,886 |
| | 1.1.2. පාසල් ලී බඩු උපකරණ අලුත්වැඩියාව | 5 | 5 | 5 | 5 | 5 | 5 | 5 | 5 | 5 | 45 |
| 1.2 | සෞඛ්‍යය (බටහිර වෛද්‍ය) | 194 | 190 | 170 | 278 | 208 | 165 | 149 | 182 | 196 | 1,732 |
| 1.3 | දේශීය වෛද්‍ය | 26 | 23 | 35 | 39 | 38 | 33 | 36 | 35 | 32 | 297 |
| 1.4 | ක්‍රීඩා | 16 | 17 | 14 | 19 | 18 | 14 | 14 | 18 | 18 | 148 |
| 1.5 | පරිවාස හා ළමාරක්ෂක | 17 | 14 | 19 | 28 | 20 | 23 | 17 | 18 | 18 | 174 |
| 1.6 | සමාජ සේවා | 11 | 12 | 25 | 22 | 19 | 14 | 12 | 12 | 12 | 139 |
| 1.7 | සංස්කෘතික කටයුතු | 5 | 5 | 5 | 6 | 5 | 5 | 5 | 5 | 5 | 46 |
| 1.8 | නිවාස | 5 | 5 | 5 | 5 | 5 | 5 | 5 | 5 | 5 | 45 |
| **2** | **ආර්ථික යටිතල පහසුකම්** | **712** | **696** | **598** | **594** | **520** | **662** | **606** | **668** | **669** | **5,725** |
| 2.1 | පළාත් මාර්ග | 405 | 291 | 240 | 136 | 70 | 286 | 187 | 232 | 251 | 2,098 |
| 2.2 | වතු මාර්ග | 22 | 32 | 25 | - | - | - | - | 34 | 23 | 136 |
| 2.3 | ප්‍රවාහන | 27 | 24 | 22 | 21 | 26 | 14 | 12 | 18 | 19 | 183 |
| 2.4 | ඉඩම් | 5 | 5 | 5 | 5 | 5 | 5 | 5 | 5 | 5 | 45 |
| 2.5 | කෘෂිකාර්මික සේවා | | | | | | | | | | |
| | 2.5.1. කෘෂිකර්මය | 26 | 50 | 44 | 73 | 68 | 53 | 58 | 55 | 50 | 477 |
| | 2.5.2. කෘෂි මාර්ග | 10 | 10 | 10 | 10 | 10 | 10 | 10 | 10 | 10 | 90 |
| 2.6 | පශු සම්පත් | 21 | 32 | 26 | 42 | 54 | 35 | 30 | 35 | 31 | 306 |
| 2.7 | මිරිදිය ධීවර | 6 | 7 | 11 | 21 | 18 | 20 | 14 | 12 | 6 | 115 |
| 2.8 | වාරිමාර්ග | 22 | 24 | 32 | 42 | 48 | 46 | 103 | 40 | 25 | 382 |
| 2.9 | ග්‍රාම සංවර්ධන | 16 | 22 | 23 | 35 | 19 | 23 | 27 | 26 | 25 | 216 |
| 2.10 | කුඩා කර්මාන්ත | 14 | 16 | 13 | 14 | 12 | 14 | 11 | 12 | 14 | 120 |
| 2.11 | ග්‍රාමීය විදුලිය | 10 | 15 | 11 | 6 | 6 | 8 | 5 | 9 | 9 | 79 |
| 2.12 | සංචාරක | 23 | 32 | 40 | 36 | 48 | 23 | 30 | 32 | 35 | 299 |
| 2.13 | තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වූ විශේෂ ව්‍යාපෘති | 55 | 70 | 40 | 83 | 76 | 70 | 45 | 80 | 95 | 614 |
| 2.14 | පසුගාමී හා හුදෙකලා ගම්මාන සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘති | 50 | 66 | 56 | 70 | 60 | 55 | 69 | 68 | 71 | 565 |
| **3** | **පළාත් පාලන හා ප්‍රජා සේවා** | **239** | **212** | **238** | **156** | **134** | **177** | **147** | **163** | **169** | **1,635** |
| 3.1 | පළාත් පාලන | | | | | | | | | | |
| | 3.1.1. පළාත් පාලන මාර්ග | 155 | 139 | 170 | 74 | 69 | 107 | 82 | 101 | 104 | 1,001 |
| | 3.1.2. සතිපොළ | 15 | 14 | 14 | 23 | 16 | 20 | 16 | 14 | 16 | 148 |
| | 3.1.3. ප්‍රජා ජල සැපයුම | 8 | 14 | 9 | 15 | 10 | 12 | 10 | 9 | 10 | 97 |
| | 3.1.4. ආදාහනාගාර | 15 | 15 | 15 | 15 | 15 | 15 | 15 | 15 | 15 | 135 |
| | 3.1.5. අපද්‍රව්‍ය කළමනාකරණය | 40 | 24 | 25 | 22 | 18 | 17 | 18 | 18 | 18 | 200 |
| | 3.1.6. මහ නගර සභාවල ධාරිතා වර්ධනය | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 9 |
| 3.2 | සමුපකාර | 5 | 5 | 4 | 6 | 5 | 5 | 5 | 5 | 5 | 45 |
| **4** | **නම්‍යශීලී අරමුදල සඳහා වූ ව්‍යාපෘති** | **15** | **15** | **15** | **15** | **15** | **15** | **15** | **15** | **15** | **135** |
| | | | | | | | | | | | |
| | **Total** | **1,452** | **1,390** | **1,305** | **1,440** | **1,190** | **1,325** | **1,190** | **1,350** | **1,365** | **12,007** |

**සටහන: දකුණු පළාත් සමාජ සේවා අංශයට වෙන් කර ඇති රු.මි.20 තුළ රිදියගම නිවර්තන නිවාසය වැඩිදියුණු කිරීම සඳහා වෙන් කළ රු.මි.5ක් ඇතුළත් වේ.**